# ශ්‍රී ලංකාව හා විකෘති මානසික ආතතියකින් පෙලෙන ජනතාව

සිරිමත් රාමනායක
එෘෂයින්

මේ රටේ ජීවත්වන මිනිසුන්ට උස් පහත් දුප්පත් පොහොසත් උගත් නුගත් සෑම කෙනෙකුටම පොදු සංකල්පයක් ඇත. එනම් තමා සිටින තැන අමතක වීමයි. ජීවත්වන සෑම 95% කටත් වඩා වැඩි පිරිසක් ජීවත් වන්නේ මනෝ ලෝකයක් තුළය. යථාර්තය පසෙකලා බොහෝ දෙනා නොපෙනෙන ලෝකයක් විස්වාස කරති. ඉතාම ආර්ථික අපහසු කම් මැද දුක් ගැහැට විඳිමින් ජීවත්වන මොවුන් තුල නොයෙකුත් සැබෑ නොවෙනා සිහින ඇත. දෙවියන් බුදුන් ට වන්දනා කොට බෝ ගස් වලට පැන් වත් කොට සිත් පහන් කරගැනීම ප්‍රධාන තැනක් ගනී. නිතරම පංසල් දේවාල වලට ගොස් වන්දනා කොට මේ භවයේ ලබා ගැනීමට නොහැකි වුන දේ මරණින් මතු උපදින ඊලඟ භවයේ ලබාගැනීමට පෙරැම් පුරයි.

වැඩි පිරිසක් ජීවත් වන කාලයට වඩා විස්වාස කරන්නේ මරණින් මතු තමනට ලැබෙන ඒ මනස් කල්පිත ජීවිතයයි. ඉතා උගත් ආදර වන්තයින් පවා මේ ආත්මයේ තමනට ලබා ගැනීමට නොහැකිවු ආදරවන්තිය හෝ ආදරවන්තයා ඊලඟ ආත්මයේ ලබා ගැනීමට පංසලකට හෝ දේවාලයකට ගොස් පහනක් පත්තු කර ප්‍රාර්ථනා කිරීම සුලභ දර්ශනයකි. ඉතා උගත් දෙමව් පියන් පවා තමන්ගේ දරැ වාගේ විභාගය සමත් වීමට ලෙඩ රෝග සුවපත් කර ගැනීමට බෝධි පුජා සෙත් සාන්ති කිරීම් ආදී නොයෙකුත් නොපෙනෙන බල වේග වලට වහල්වී ඇත. තම ජීවන තත්වය උසස් කරගැනීමට වඩා බොහෝ දෙනා කරනුයේ ඔහේ ජීවිතය පාවී යාමට ඉඩ දීමයි.

විසාල පිරිසකට අනාගත බලාපොරොත්තු නැත. යන්නන් වාලේ ජීවිතය ගෙවා දමති. රටේ සෑම කෙනෙකුටම දේශපාලනික වශයෙන් රට නව මාවතකට යොමු කිරීමට අවශ්‍ය වුවත් එය කතාවට පමණි. මෙයින් වඩා ප්‍රයෝජන ගන්නේ කුඨ දේශපාළුවන්ය. ජාතිවාද කුලවාදය ආගාමී වාදය මේ මිනිසුන්ගේ සිත්වල පතුලටම කිදා බැස ඇත.

සෑම මිනිසෙකෙකුගේම මනස කුහක කමින් පිරී ඇත. අසල්වැසියාගේ සිට කාර්යාල යේ ඉහල සේවකයාගේ සිට පහල සේවකයා දක්වා කෙනෙක් තමන් පසුකර ඉහලට යනවාට හෝ දියුණු වනවාට කැමති නැත. දේශපාලන පක්ශයක වල වහලුන් වී ඇති බොහෝ පිරිස් ඉන් මිදී ලෝකය දෙස දෑස් විවර කර බැලීමට කැමැත්තක් දක්වන්නේ නැත.සමහරු කොලපාට බදාගෙන ඇති අතර සමහරු නිල් පාට හා රතුපාටත් බදාගෙන සිටී. තවත් සමහරු ජාතිවාදය හා වෛරය මුසුවු පොහොට්ටුව බදාගෙන ඇත. බොහෝ උගත් පිරිස් සිටින ජනතා විමුක්ති පෙරමුණෝ පවා තම නායකයින්ගේ රස කතා විස්වාස කරමින් ලෝකයේ සිදුවන්නේ කුමක් දැයි නොදන්නා වහල් පිරිස් අනන්තය.

මෙවැනි මානසික සංකලනයකින් යුත් පිරිසක් මේ රට 21 වෙනි සියවස කරා ඉදිරියට ගෙන යාවිද ..? පිලිතුර ඔබම සොයා ගන්න




37 වන පිටෙන්

ගන්නවා. අන්න ඒ විදිහට තමයි මම පොත පටන්ගත්තෙත්. සිනමාව හැදෑරීමෙන් ලත් අභාෂය තමයි මේ අකෘතියෙන් ප්‍රකාශයට පත් වෙන්නේ.

**පොත එළිදැක්වීම සිදුවුණේ කොයි විදිහටද?**

විජේරාමේ තැප්රෝබේන් එකේදි අගෝස්තු තුන්වෙනිදා අපේ හැදෑරීම් කවයේ අයගේ සහ දන්නා හඳුනන කිහිප දෙනෙකුගේ සහභාගිත්වයෙන් තමයි එළිදැක්වීම සිදුකළේ. විශේෂ කතා පැවැත්තුවෙත් ඒ අය අතරින් දෙන්නෙක්. පොත එළිදක්වන්නට පැය එක හමාරකට විතර කලින් මිරිහාන පොලිසියෙන් ඇවිත් මාවයි සන්නස්ගලවයි අත්අඩංගුවට අරන් පොලිසියට ගෙන ගියා. බෞද්ධ තොරතුරු කේන්ද්‍රයෙන් කෙරුණු පැමිණිල්ලක් අනුව තමයි පොලිසිය ඇවිල්ලා තිබුණේ. අපි පොලිසියට පැහැදිලි කළා මේකේ එහෙම අපහාසයක් නෑ කියලා. අපේ කටඋත්තර ලියා ගෙන අපිව නිදහස් කළා.

**පොත එළිදක්වන්නටත් කලින් සමාජයෙන් ලැබුණු ප්‍රතිචාර ගැන මොකද හිතන්නේ ?**

මට ලැබුන ප්‍රතිචාර ඉතාම සාහසික ප්‍රතිචාර වුණත් ඒවා මා විශේෂිත පුද්ගලයෙක් කොට සළකලා ලැබුණ ප්‍රතිචාර කියා මම හිතන්නේ නෑ. ඕනෙම කෙනෙක් ගැන වැරදි ප්‍රචාරයක් ගියොත් සමාජයෙන් ලැබෙන ප්‍රතිචාර තමයි මටත් ලැබුණේ. සංහිඳටත් කෝල් කරලා කීප දෙනෙක් කුණුහරුපෙන් බැනලා තියනවා.

**පොත ප්‍රකාශයට පත්වෙන්නත් කලින් පිරිසක් පොතට එරෙහිව යුද ප්‍රකාශ කරනවා. අනෙක් පැත්තෙනුත් පොත ඇහැටවත් නොදැකපු නාමධාරී පුද්ගලයන් ප්‍රමුඛ තවත් පිරිසක් ඊට එරෙහිව සටන් පෙරමුණට එනවා. සමාජයේ ස්ථර දෙකක මේ සමාන හැසිරීම ගැන ඔබට මොකද හිතෙන්නේ?**

පොතේ අන්තර්ගතය ගැන කිසිම අදහසක් නැතිව පොත වෙනුවෙන් ෆයිට් කරන අය එහෙම කරන්නේ ප්‍රකාශන නිදහස සම්බන්ධයෙන් ව්‍යවස්ථාවේ ඇති වගන්තියක් අල්ලාගෙනයි. අර ගොල්ල ඒගොල්ලන්ගේ ආගමික ශ්‍රද්ධාවේ ප්‍රමාණය අනුව පොතේ නම අල්ලගෙන යුද්ධ ප්‍රකාශ කරනවා. මේක කලා කෘතියක් නිසා මේකට පණ තියනවා. එය සමාජ ස්ථරයන්වල වැඩකරන විදිහ තමයි ඔය පෙනෙන්නේ.

**මේ සියල්ලම පොත අලෙවි කරගැනීම සඳහා යෙදූ වෙළඳ උපක්‍රමයක ජවනිකා බවටත්, ඒවාට සමාජයේ බහුතරය රැවටී ඇති බවටත් අදහසක් ප්‍රකාශ වෙනවා නේද?**

මේ පොත පීඩීඑෆ් කරලා එෆ්බී එකේ යනවා. හැම පිටුවකම ගංජා කොලයක් දාලා, පිදුමකුත් දාලා තමයි ඒක කරලා තියෙන්නේ. මේකට විරුද්ධව සන්නස්ගල බුද්ධිමය දේපල නීතිය යටතේ නඩු පවරන්න තීරණය කරලා තියෙන්නේ. ඔය කියන විදිහට මේක අළෙවි උපක්‍රමයක් නම් ඒ විදිහට පොතේ පීඩීඑෆ් එකක් ෆේස් බුක් දායි කියා මම හිතන්නේ නෑ. මොකද එහෙම කළාම අලෙවිය අඩුවෙන නිසා.

**චිත්‍රපටි සංස්ථාවේ ඩිප්ලෝමාවකින් ආරම්භ කරලා, නූතන ගැඹුරු විෂය ධාරාවන් හදාරන විද්‍යාර්ථියෙකු බවට පත්වීම දක්වා ඔබේ ජීවිතය ගොඩනැඟුනේ කොයි විදිහටද?**

මම ඉපදුනේ 1987 සැප්තැම්බර් හයවෙනිදා තිස්සමහාරාමෙ දෙබරවැව. මායි නංගියි අම්මයි තාත්තයි තමයි අපේ පවුල. තාත්තා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලිපිකරුවෙකු ලෙස සේවය කළා. අම්මා ඇඳුම් නිර්මාණ ශිල්පිනියක්. පස්සේ අපේ පදිංචිය කොළඹට මාරු වුණා. ටවුන්හෝල් එකේ මහා බෝධි විද්‍යාලය තමයි පළමුවෙනියට ගිය ඉස්කෝලේ. ශිෂ්‍යත්වය සමත්වෙලා වනාතමුල්ලේ වේලුවන විද්‍යාලයට ඇතුළත් වුණා. උසස් පෙළ වාණිජ අංශයෙන් ඉගෙන ගනිමින් ඉන්න අතරේ අධ්‍යාපන ක්‍රමය ගැන තිබුණ විවේචනය හේතුවෙන් උසස් පෙළ විභාගයවත් නොකර මම පාසල් අධ්‍යාපනය අතෑරියා. ඊට පස්සේ මම සපත්තු කඩයක වැඩකළා. රට යන්න හැදුවා. හරි ගියේ නෑ. යාලුවෝ හරහා එක එක දේශපාලන කවවල ලිපි මගේ අතට එන්න පටන් ගැනීමත් සමඟ මගේ කියවීම හුඟාක් වෙනස් වුණා. ඊට පස්සේ මට හිතෙනවා මේක හරියන්නේ නෑ මම සිනමාකරුවෙක් වෙන්න ඕනේ කියලා. පාසල් නාට්‍යවල රඟපාලා තිබුණ නිසා කවදා හරි සිනමා කෘතියක් කරනවා, මම අධ්‍යක්ෂවරයෙක් වෙනවා කියන දැක්ම මට තිබුණා. සිනමාකරණය හැදෑරුව ගමන් මට ඇඩ්වර්ටයිසින්වලට යන්න අවස්ථාවක් ලැබෙනවා. ක්‍රියේටිව් රයිටර් කෙනෙක් විදිහට යාලුවෙක් ළඟ ටික කාලයක් වැඩකරනවා. කෙටි චිත්‍රපටි වෙළඳ දැන්වීම්වල සහාය අධ්‍යක්ෂවරයෙක් විදිහටත් වැඩකරනවා. දැනට රැකියාවක් කියලා දෙයක් නෑ. ෆ්‍රීලාන්ස් කරනවා.

## කවියෝ කියන වග

ආවා සොයාගෙන කොළඹට යන පාර
බීවා ශැන්ගිලා හෝටලයෙන් තාර
පෑවා ගතිය එඩිතර වීරෝදාර
මෙවා හොදම ආතල් ලොව අවිචාර

වෙත්තසිංහ

